**විසර්ජන ශීර්ෂය 183 - මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය.**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**
---------------------------------------------------------------------------------------

## 1.1 විගණන විෂය පථය

මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසදුම් ප්‍රකාශන පොත් පත්, ලෙඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසදුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) විසර්ජන ගිණුම

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.160,028,000ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 134,333,472ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.25,694,528ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 49,000,000 | 49,000,000 | 278,783 | 0.5 |
| මූලධන | 110,000,000 | 111,028,000 | 25,415,745 | 23 |
| එකතුව | 159,000,000 | 160,028,000 | 25,694,528 | |

(ii) අයවැය විචලනය

- වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.149,800 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 04ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.13,891,912 ක් වූ අතර එය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට11 ත් සියයට 78 අතර පරාසයක ප්‍රමාණයන් ගෙන තිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුම.

අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 01ට වැඩි වර්ෂ 02ට අඩු රු.661,613ක ශේෂයක් විය.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

ඉහත 1.4.1 ජේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

### 1.4.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වී නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1ට අඩු බැරකම් රු.6,650,719ක් විය.

## 1.6 කාර්යසාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ජනසෙතට ජන හවුල ප්‍රජා සත්කාරක ජංගම සේවාවන් 04ක් පැවැත්වීම සඳහා රු.මිලියන 2.5ක් වැයකර තිබූ අතර ඉදිරිපත් කර තිබූ ගැටළු 5,064 කින් 3,450කට විසඳුම් ලබා දී තිබූ අතර ගැටළු 1,614ක් සඳහා විසඳුම් ලබා දී නොතිබුණි.

(ආ) රාජ්‍ය ආයතනවලින් සේවා ලබා ගැනීමේ දී පවතින බාධක අඩු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 15ක් වෙන්කර තිබුණද ඒ සඳහා වැයකර තිබුණේ රු.මිලියන 1.2ක් පමණි.

## 1.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මාස 06ට වැඩි වර්ෂයට අඩු නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු.35,839ක් වූ අතර හඳුනා නොගත් ලැබීම්වල වටිනාකම රු.210ක් විය.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 10 | 07 |
| (iii) | ද්විතියක මට්ටම | 09 | 04 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | එකතුව | 44 | 31 | 13 |